(08)

ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - මාතලේ
பிரதேச செயலகம் - மாத்தளை
DIVISIONAL SECRETARIAT – MATALE

දුරකථන/தொலைபேசி/Telephone
කාර්යාලය/அலுவலகம் /Office 066 2222238
ප්‍රාදේශීය ලේකම් / பிரதேச செயலாளர் / Divisonal Secretary 066 2222733
වෙබ් අඩවිය / இணைய தளம் / Web Site www.matale.ds.gov.lk
විද්‍යුත් තැපැල / ஈ - மெயில் / e-mail ds@matale.ds.gov.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax 066 2222238

මගේ අංකය / எனது இல / My No: DSM/ML/ACC/04/2025/25
ඔබේ අංකය / உமது இல. / Your No:
දිනය / திகதி / Date: 2025.07. 14

කළමණාකරු,
..........................................
..........................................
..........................................

මහත්මයාණෙනි/මහත්මියණි

**නාම පුවරු (Name Board) සහ මහ පෙන්වීමේ පුවරු(Direction Board) සවි කිරිමේ ව්‍යාපෘතිය-2025**

**මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සංචාරක ආකර්ෂණයෙන් යුතු ඇමුණුමේ සඳහන් ස්ථානයන්හි නාම පුවරු (Name Board) සවි කිරිම වෙනුවෙන් මෙයින් ලංසු කැඳවනු ලැබේ.**

ලංසු ඉදිරිපත් කිරිමේදී පහත සඳහන් කොන්දේසි වලට අදාළව ඉදිරිපත් කල යුතුයි.

I. ලංසු සමඟ ඉදිරිපත් කරනු ලබන නාම පුවරු (Name Board)වලට අදාල වගකීම කාලය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

II. ඉදිරිපත් කරනු ලබන ලංසු, ලංසු භාරගන්නා අවසන් දින සිට දින 60 ක් දක්වා වලංගු විය යුතු අතර ලංසු සනාථ කිරිම සඳහා ඔබේ/බලයලත් නිලධාරියාගේ අත්සන යොදා එය ආයතනයේ රබර් මුද්‍රාවෙන් සනාථ කර තිබිය යුතුය.

III. වැට් සහිත හා වැට් රහිත අගයත්,වට්ටම් ලබා දෙන්නේ නම් එම වට්ටමත්, වෙන වෙනම පැහැදිලිව සඳහන් කර තිබිය යුතු අතර වැට් බදු ලියාපදිංචි අංකය සහ වර්ථමාන වැට් බදු ගෙවීම් තහවුරු කිරීම් ලේඛනයක් ඉදිරිපත් කල යුතුය.

IV. සියළුම ලංසු මුද්‍රා තැබූ කවර වල බහා ලියාපදිංචි තැපැල් මගින් හෝ අතින් ගෙනවිත් භාර දිය හැකි අතර ලංසු බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ <u>**නාම පුවරු (Name Board) සහ මහ පෙන්වීමේ පුවරු(Direction Board) සවි කිරිමේ ව්‍යාපෘතිය -2025**</u> යන්න සඳහන් කර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, මාතලේ යන ලිපිනයට එවිය යුතුය.අතින් ගෙනවිත් භාර දෙන ලිපි ඉහත ලිපිනයෙහි ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය.

V. ලංසු ඉදිරිපත් කර ඇති ආයතනය විසින්ම නාම පුවරු (Name Board) සවි කිරීමේ කටයුතු කළ යුතු අතර එය ඇමුණුමේ සඳහන් ස්ථානයන්හි සවි කර දිය යුතුය.මෙහි දක්වා ඇති ස්ථාන වෙන වෙනම පරීක්ෂා කර බලා අමුණා ඇති සටහනෙහි පිරිවිතර භාවිත කරමින් එම තැනට සුදුසු පරිදි නාම පුවරු සැකසීම,ඊට අදාල යකඩ රාමු සකස් කිරිම හා සවි කරීමට අදාල මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.(එය පිරිවිතර හා නොගැලපේනම් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව ද දන්වා සිටිමි.

VI. ඡායාරූප යොදා සකස් කරනු ලබන ග්‍රැෆික් නිර්මාණ සඳහා (Graphic Design) මෙම කාර්යාලය සම්බන්ධීකරණය කර ගත යුතුය.

VII. මෙම දැන්වීම <u>www.matale.ds.gov.lk</u> යන කාර්යාලයීය වෙබ් අඩවියේද පල කර ඇත



CamScanner

VIII. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් වෙනස් කළ නොහැකි වන සේ විනිවිද පෙනෙන සෙලෝ ටේ
අලවා සීල් කර තැබිය යුතුයි.

IX. මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

02. ලංසු භාර ගැනීම 2025.07.29 වන දින ප.ව. 2.00 ට අවසන් කෙරේ. ලංසු භාර ගැනීම අවසන් කළ වහාම ඒ
විවෘත කරනු ලබන අතර, ලංසු විවෘත කරන අවස්ථාවට ඔබට හෝ ඔබගේ ලිඛිත බලයලත් නියෝජිතයෙකුට සහභා
හැකි බවද කාරුණිකව දන්වමි.

එස්.ජී අසංග ලක්මාල්,
ගණකාධිකාරී,
ප්‍රාදේශීය ලේකම් වෙනුවට,
O/C

එස්.ජී. අසංග ලක්මාල්
ගණකාධිකාරී
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මාතලේ.

CamScanner